මහා වංශයක් තිබුණාට රට කරන්නේ ලපයි සිපයි ධනපති පංතියක්

මට මතක හැටියට මට මාදුළුවේ සෝභිත සාදු එදා හමු වුණේ යුරෝපයේ ගුවන් තොටුපලක රස්තියාදු වෙන වෙලාවක. මං උන්වහන්සේගෙන් ඇහැව්ව "හාමුදුරුවනේ ඉස්සරවත් පන්සල විවාහ මඟුලට සම්බන්ධ වුණේ නැද්ද" කියලා. සෝභිත හාමුදුරුවෝ මට පැහැදිලි කළා, ගම්පොල යුගය වෙන කොටත් විවාහය සිදු වුණේ පන්සලේදී සංඝයා පිරිත් නූලකින් දෙන්නා එකට ගැට ගැසීමෙන් කියලා. ඊට පස්සේ දානය දීලා ඉවර වෙලා නැදෑ හිතමිතුරන් දාන ශාලාවේදීම ආහාර වේලක් අරන් මඟුල් බෙර වාදන හා නැටුම් බලලා ජෝඩුවත් එක්ක යන්න ගියාලු මං එදා, දැනට අවුරුදු විස්සකට වගේ ඉස්සෙල්ලා, කල්පනා කළා ඇයි ඒ සිරිත දන් කෙරෙන්නේ නැත්තේ කියලා. ඒත් අද වෙනකොට මෙන්න ඒ විදියටම මඟුල් කන පන්සල් මඟුලකට මට හවුල් වෙන්න සිද්ධ වුණා. අමිත්ත විරසිංහ හුඟ කලක් රැකියාව කළේ අපේ පක්ෂ කාර්යාලය තියෙන ගොඩනැගිල්ලේ පහළ තට්ටුවක. ඒ නිසා නිතර දකින නළුවෙක් බවට අමිත්ත පත්වුණා. මේ යාළුකම හින්දා වෙන්න ඕන අමිත්ත තකහනියෙම ඇවිත් මට ආරාධනා කළේ. මාත් යන්නම හිතුවේ පන්සල් මඟුලක් දැකගන්න මං පතාගෙනම හිටි නිසයි.

එතැනට ගියහමයි මට දැනුනේ හුඟ දෙනෙක් මාව අඳුනගෙන සිනහවෙන් පිළිගත්ත බව. කොයි එකටත් මගෙ තනියට ජයදේවත් හිටිය. ගංගාරාමේ පොඩි හාමුදුරුවෝ වගේම සිද්ධාර්ථ හාමුදුරුවන් ඇතුළු සංඝයා මාව අඳුනගෙන කථා කළ එකත් ලොකු දෙයක්. කුඩා පක්ෂයක් වුණත් අපි ගැන දන් හැම කෙනෙක්ම දන්න පාටයි. ඒක ලොකු දෙයක්. සතිස්චන්ද්‍ර එදිරිසිංහ මහත්තයත් නැගිටලා ඇවිත් කථාබහ කරලා ගියා. ඒක නම් ඔළුව ඉදිමෙන්න තරම් වැඩක්. ඒකෙන් පස්සෙ මාත් බයක් හැකක් නැතිව ඔළුව උස්සලා වටේටම කරකවලා බලල බර දාලා වාඩිවෙලා හිටිය. එක පාරටම බෙර වාදනයක් එක්ක පිරිසක් ආවා. පණික්කියයි, ආවතේවකාරයොයි රදළ ප්‍රභූන් අතර මුදළි එනව වගේ නෙවෙයි මේ කට්ටිය ආවේ. මුලින්ම වරකගොඩ පුත්‍රයා රාජසිංහයන් එනව වගේ ඔළුව පස්සට දමල, තම්මැට්ටමට තලමින් ආව. එයා පස්සෙන් සෙනෙවියො වගේ නාද කරමිනුයි අනෙක් අය ආවේ. ඒ ඇත්තො බෙර ගැහැව්ව නෙවෙයි ඇත්තටම බෙර වාදනය කළා. මං පුටුවෙන් බාගෙට නැගිටලා අහන් හිටිය. මගේ මුළු ඇඟම නටන්න ගත්ත. බෙර වාදනය නිකම්ම ප්‍රාකෘත වැඩක් නෙවෙයි, ලොකු සංස්කෘත කෙළියක්. බටහිර ඩ්‍රම් සෙට්වලට කරන්න බැරි දේවල් බෙර දවුල්වලට පුළුවන් බව මං දනං හිටිය. ඒක මං දනගත්තෙ බෙර දවුල් එක්කල නාගසලම් එකතු වෙලා තියපු සංදර්ශනයකදි. මේ මඟුල් ගෙදරදි වරකාගොඩ පුත්‍රයගේ කණ්ඩායම නැටුම් ගැයුම් ඉදිරිපත් කරද්දී ලතා ඇතුළු ඉස්තරම් ගායකයෝ කිහිප දෙනෙක් වරින්වර ගීත ගායනා කළා. සිංහල සිරිතට විරිතට අනුව පංකාදු පහට මේ මඟුල ලැස්ති කරලා තිබුණා. මගේ වාසනාවට මං ඇඳන් ගියේ පිත්තල පාට ආරිය රෙදි බැනියමකුත් සැහැල්ලු කලිසමකුත්. එතැනට ඒක නියමෙට ගැලපුනා. කළු ටයිබයිකාරයෝ කිහිපදෙනෙක් ඇවිත් අමාරුවෙන් ඇඹරෙනවා මං දැක්කා.

සිංහල අනන්‍යතාවය අවුරුදු දෙදහස් පන්සියයකටත් වැඩියි. මේ දිග වරිග ඉතිහාසය තුළ මොන තරම් සංස්කෘතිකාංගයන් අපට එකතු වෙලා තියෙනවද? මේ තරම් දිග වරිග කථාවක් ලොකේ කොහේවත් මනුස්ස කොටසකට නෑ. යුදෙව්වන්ට අවුරුදු හාරදහසකට වැඩි, වරිග කතාන්දරයක් තිබුණත් ඒ ඇත්තෝ ඊශ්‍රාලයට යළි බලෙන් ඇතුල් වුණේ මේ මෑතදී, අවුරුදු දහසක් විතර ලෝකය

පුරා විසිරිලා ඉඳලා. ඒ අනුව විසිරුන ඉතිහාසයක් එතැන තියෙන්නේ. ලෝකයම ජය ගත් ඉංග්‍රීසිකාරයගේ ගමන ආරම්භ වෙන්නේ 1066 දී නෝමන් විලියම්ගේ (Norman) කඩාවැදීමත් සමඟ. ඇත්තටම ඇන්ග්ලෝ-සැක්සන් කථාව පටන් ගන්නේ රොබින් හුඩ්ගේ කාලයේදී. ඒ කියන්නේ සිංහ හද ඇති රිචඩ්ගේ (Richerd the lion heart) කාලයේ. (1190). ඉංග්‍රිසි කාරයාගේ සිංහයාට අවුරුදු දහසක්වත් නෑ. අපේ සිංහයාට වයස අවුරුදු දෙදහස් පන්සියයකටත් වැඩියි. මේ වගේ අසිරිමත් ලකුණක් ඇති බුදු දහමෙන් නුවන ලැබූ සිංහලයන් අද හැසිරෙන්නේ අද ඊයේ කැලෙන් එළියට බැහැපු නැහැදිච්ච දීනයන් වගේ. මෙච්චර බලගතු සිංහලයන් තමන් එකට ඉන්න තමන්ගෙන්ම හැඳුන දෙමළට, මුස්ලිමයට අරියාදු කරන්න ගිහින් දන් ලෝකයාටම විහිළුවක් වෙලා. මේකට හේතුව, සිංහ තේජස තියෙන ජාතියට ඉන්නේ කුඹී මොළ තියෙන නායකයෝ. මේ නායකයින්ට තිබෙන ලොකුම ප්‍රශ්නය හීනමානය. මහා වංශයක් තිබුණට තමන්ගේ තරම තමන්ම දන්නේ නෑ. ගැටළුව මේකයි. මහා වංශය වුනාට රට කරන්නේ අඩු දියුණු ලපයි සිපයි ධනපති පංතියක්. මේ පංතියට පුළුවන් දීන බල්ලන් වගේ ළඟ ඉන්න එකා හපා කන එකයි. වෙන පුළුවන් දෙයක් නෑ.

වර්ගයක්, වංශයක්, ජාතියක් බවට පත් වෙන්නේ ධනපති වෙළඳපොල තුළ ඇති වන සිවිල් සමාජය තුළින්. එතකොට ප්‍රභූන්ට සීමාවන නැත්නම් ප්‍රාදේශීය වශයෙන් කොටුවුණ, කුළවලට සීමා වුණ, සංස්කෘතික සම්පත් හැමටම අත්පත් වෙනව. ඒ විතරක් නෙවෙයි ඒවා තාක්ෂණ දියුණුව අනුව වර්ධනය වෙනවා. මේ පෙරළිය මේ මඟුල් ගෙදරදීත් මනාල ජෝඩුවේ සිට රූගුම් ගැයුම් දක්වා බලාගන්න පුළුවන් වුණා. දන් තුප්පොට්ටිය හැමටම පොදු මංගල ඇඳුමක් වෙලා. පහතරට නිළමේ ඇඳුමක් කැළණිය පන්සලේ පෙරහැරෙ දක්නට ලැබුණත් එය පොදු සිංහල ආයිත්තමක් වෙලා නෑ. සමහර විට එය ඉංදියානු දෙයක් හැටියට ළඟදී ආව එකක් කියලා හිතන නිසා වෙන්න ඇති. තුප්පොට්ටිය අද සිංහලයගේ මංගල ඇඳුම හැටියට ඉදිරිපත් වෙන්නේ ඔසරියත් සමඟයි. ඔසරිය ලංකාවට අනන්‍ය සාරි ඇඳීම හැටියට සලකන්න පටන් අරන්. බෙර වාදනය පමණක් නොවෙයි පොදුවේ සංගීතයත් දන් අපේම මාවතක ඉදිරියට ඇවිත්. අළුත් රිද්මයන් තුළිනුත් ජන කවිය එළියට ඇදෙනව. "රබන් ගහන්නට පදයක් කියපන්, පෙරත්ත නැතුවම කරත්තේ නැගපන්" වගේ පදමාලා ඇති සිංදු නූතන වර්ධනයට ජන කවිය එකතු කිරීමක් කියලා තර්ක කරන්නට පුළුවන්. කොහොමටත් සෑම කලා අංශයකම වර්ධනය තුළත්, දර්ශනවාදයේ හා පොදුවේ තාක්ෂණයේ වර්ධනය තුළත්, සිංහල අනන්‍යතාවය අලුත් කරලා ඉහළට ගෙනියන්න සිංහල පඬිවරුන්ට පුළුවන් වෙලා. බහුජාතික සමාගම් තන්ත්‍රය සියළු අනන්‍යතා විනාශ කරලා යැංකි තාලයට නටන මනුස්ස සමාජයක් ගොඩනගන්න බිහිසුනු මර්ධනයක් ලෝකය පුරා දියත් කරද්දි මේ පුංචි රට තුළ සිංහල අනන්‍යතාවයත් රැකගෙන යන ගමනක් ගැන සිතන සෑම කලාකාරුවෙකුටම, පඬිවරයෙකුටම, අප සිරස නැමිය යුතුයි. ඒත් අපගේ අනන්‍යතාවය තව කෙනෙකුට හිරිහැරයක් වෙනව නම් ඒකෙන් කෙරෙන්නේ අපි අප ගැනම නොදන හීන වී වැඩ කරන බවයි. අධිමානය මොඩකමක්. හීනමානය තකතීරුකමක්.